# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1991 අංක 16 දරන
# පරිපාලන කටයුතු පිළිබඳ
# පාර්ලිමේන්තු කොමසාරිස්
# (සංශෝධන) පනත

---

]සහතිකය සටහන් කළේ 1991 මාර්තු මස 15 වන දින.[

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1991 මාර්තු මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.**

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : ශත 30 යි. තැපැල් ගාස්තුව : රු. 100 යි.

## 1991 අංක 16 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1991 මාර්තු මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 34/89

1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—**

1. මේ පනත 1991 අංක 16 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනතේ 3 වන වගන්තියේ (5) වන උපවගන්තියේ (ඇ) ඡේදය වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— *1981 අංක 17 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.*

"(ඇ) වයස අවුරුදු හැත්තෑව සම්පූර්ණ කළ විට ;".

3. (1) මේ පනතේ 2 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය 1989 අගෝස්තු මස 1 වන දින බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය. *අතීතයට බලපෑම සහ වලංගු කිරීම.*

(2) 1989 අගෝස්තු මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාලය තුළ ඔම්බුඩ්ස්මන් ධුරයට යම් තැනැත්තකු පත්කිරීම හෝ යම් තැනැත්තකු එම ධුරයෙහි අඛණ්ඩව කටයුතු කර ගෙන යාම හෝ, අවස්ථාවෝචිත පරිදි, එසේ පත් කරනු ලැබූ හෝ ධුරයෙහි අඛණ්ඩව කටයුතු කරගෙන ගිය හෝ තැනැත්තා, ඉහත කී කාලය තුළ කවර වූ හෝ අවස්ථාවක දී වය සින් අවුරුදු හැට අටට වැඩිවීමේ හේතුව නිසා ම පමණක් අවලංගුව නොතිබුණු බව හෝ අවලංගු නොවන බව සලකනු ලැබිය යුතු ය.

(3) 1989 අගෝස්තු මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාලය තුළ ඔම්බුඩ්ස්මන් ධුරය දරන තැනැත්තා විසින්, ප්‍රධාන ප්‍රඥප්තියෙන් ඔම්බුඩ්ස්මන්වරයා වෙත පිරිනමන ලද්දා වූ හෝ නියම කරන ලද්දා වූ හෝ පවරන ලද්දා වූ හෝ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම, අවස්ථාවෝචිත පරිදි එසේ ක්‍රියාත්මක කිරීමේ හෝ ඉටුකිරීමේ අවස්ථාවේ දී ඒ ධුරය දරන්නා වයස අවුරුදු හැට අටට වැඩිවීමේ හේතුව නිසාම පමණක් අවලංගුව නොතිබුණු බව හෝ අවලංගු නොවන බව සලකනු ලැබිය යුතු ය.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. *අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.